ඔරියන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනය විසින් පිරිනමනු ලබන නිෂ්පාදනයන්ට සහ සේවාවන්ට අදාළ සුවිශේෂී මූලික කරුණුවලින් සමන්විත මෙම ලේඛනය මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවල සීමාවන්ට සහ විධිවිධානයන්ට අනුව සකස් කරන ලද්දකි.

පහත සඳහන් කොන්දේසි, නියමයන්, ගාස්තු සහ මිල ගණනය කිරීම් ආයතනයේ අභිමතය පරිදි සංශෝධනය කිරීමට, ඉවත් කිරීමට හෝ අලුතෙන් එකතු කිරීමට ආයතනයට පූර්ණ බලය ඇත.

## A. නිෂ්පාදන සහ සේවාවන්

ඔරියන්ට් ෆිනෑන්ස් පී.එල්.සී. ආයතනය විසින් පහත සඳහන් නිෂ්පාදන සහ සේවාවන් සිය පාරිභෝගිකයාට පිරිනමනු ලැබේ.

| නිෂ්පාදන/සේවාවන් | විස්තරය | ප්‍රධාන නිෂ්පාදනයේ විශේෂතා, කොන්දේසි සහ නියමයන් |
|---|---|---|
| කල්බදු සේවාව | මූල්‍ය කල්බදු සේවාව ප්‍රධාන වශයෙන් ලබා දෙන්නේ පුද්ගලික අවශ්‍යතාවයන් සහ ව්‍යාපාරික අවශ්‍යතාවයන් සඳහා භාවිතා කරනු ලබන ලියාපදිංචි කළ සහ ලියාපදිංචි නොකළ රථ වාහන සඳහාය. ඊට අමතරව නවීන යන්ත්‍රෝපකරණ ද මූල්‍ය කල්බදු සේවාව සඳහා සළකා බැලේ. මූල්‍ය කල්බදු සේවාව ලබා ගැනීමට නම් අයදුම්කරු හෝ අයදුම්කාරිය නියමිත කාල සීමාව තුළ කල්බදු ගෙවීම් සපුරාලීම සඳහා තමා තුළ වන ශක්‍යතාවය තහවුරු කළ යුතුය. | • යම් කිසි වත්කමක් තමන් සතු කර ගැනීමේ අවශ්‍යතාවය ඇති සහ කල්බදු ගෙවීමේ හැකියාව ඇති ආයතනයක් කල්බදු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.<br>• ණය සඳහා වන අගය අනුපාතය (Loan toValue - LTV) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය සහ අයදුම්කරුගේ යෝග්‍යතාවය මත තීරණය වේ.<br>• කල්බදු කාල සීමාව - මාස 12ත් 60ත් අතර කාල සීමාව තුළ නැවත ගෙවීම : පෙර එකඟතාවය ලද කාලසටහනට අනුව සමාන වාරික කොටස් වශයෙන් හෝ හිඟ මුදල් සමඟ එකවර හෝ ගෙවීම් කළ යුතුය. |
| ණය | ණය ඉල්ලා සිටින්නන්ගේ පුද්ගලික සහ ව්‍යාපාරික අරමුණු සපුරාලන මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ණය නිකුත් කරනු ඇත. පුද්ගලික ණය නිකුත් කිරීම සැලසුම් කර ඇත්තේ නිවාස ඉදිකිරීම, නිවාස මිලට ගැනීම හා වෙනත් උපකරණ මිලට ගැනීම වැනි ආනුශාංගික කටයුතු සඳහාය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සහ සංස්ථාපිත ආයතනයන්ගේ මූලික හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යමය වශයෙන් සපුරාලීම වෙනුවෙන් ව්‍යාපාරික ණය සැලසුම් කර ඇත. | • ණය කාල සීමාව මාස 03 සිට මාස 60 දක්වා<br>• ආපසු ගෙවීම : හිඟ ශේෂය මත පදනම් වූ ස්ථාවර අනුපාතයකින් පොලී අය කෙරෙයි.<br>• පෙර එකඟතාවය ලද කාලසටහනට අනුව සමාන වාරික කොටස් වශයෙන් හෝ හිඟ මුදල් සමඟ එකවර හෝ ගෙවීම් කළ යුතුය.<br>• ඇපකරුවන්, ස්ථාවර තැන්පතු, දේපළ උකස් කිරීම, වාහන බදු දීම මගින් හෝ ආයතනයට යෝග්‍ය වන වෙනත් ඕනෑම ආකාරයකින් වගකීම සහ ආරක්ෂාව ඉල්ලා සිටිය හැකිය.<br>• සේවාලාභියා විසින් නියමයානුකූලව අඩු වන |

| | | |
|---|---|---|
| | | රක්ෂණාවරණ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>• පශ්චාත් ගෙවීම් දින සටහන් කළ චෙක්පත් ද වලංගු වේ. |
| සාධකකරණය/ෆැක්ටරින් | ව්‍යාපාරවල කෙටි හා මධ්‍ය කාලීන කාරක ප්‍රාග්ධන අවස්ථා සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබේ. | **ඉන්වොයිස් ෆැක්ටරින් / චෙක් වට්ටම්**<br>වෙළෙඳපොල ණය මත පිළිගත හැකි සහ වේගයෙන් වෙනස් වන නිෂ්පාදන (භාණ්ඩ හා සේවා) සහිත ව්‍යාපාර (වඩාත් සුදුසු වන්නේ දින 120ක කෙටිකාලයක් සඳහා පමණි) තෘප්තිමත් ණය පදනමකින් යුක්තය.<br>• ණය සීමාව අයදුම්කරුගේ ප්‍රාග්ධන අවශ්‍යතාවය, මූල්‍ය චක්‍රය, මූල්‍ය ස්ථාවරත්වය සහ අතීත වාර්තා මත පදනම් වී ඇත.<br>• විකුණුම්කරුගේ සහ ගැනුම්කරුගේ එකඟතා මත මූල්‍ය චක්‍රය හා ණය කාල සීමාව තීරණය වේ.<br>• අරමුදල්වල පිරිවැය, අනෙකුත් ගෙවීම් සහ අයවැය සටහනට අනුව ලැබෙන ආදායම මත සාධකකරණ/ෆැක්ටරින් ඒකකයක මිල තීරණය වේ.<br>• ලබා ගත හැකි සීමාව අභිබවා යන මුදලකට අමතර පොලියක් අය කරනු ලැබේ.<br>• ණය කාල සීමාව සහ උපරිම පූර්ව ගෙවීම් ප්‍රතිශතය මත පරිපාලන සහ ප්‍රති සාධකකරණ ගාස්තු තීරණය වේ.<br>• ණය ගැනීමේදී ඇපකරයක් ලෙස ආරක්ෂාව ඉල්ලා සිටීම<br><br>පිරිවැටුප් ණය පහසුකම්<br>• ඉහළ මූල්‍ය පසුබිමක් සහිත පිළිගත් ව්‍යාපාරික ආයතනයක් වීම<br>• උපරිම මාස 12ක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා<br>• ආපසු ගෙවීම - පෙර එකඟතාවය ලද කාලසටහනට අනුව සමාන වාරික කොටස් වශයෙන් හෝ හිඟ මුදල් සමඟ එකවර හෝ ගෙවීම් කළ යුතුය.<br>• ඇපකරුවන්, ස්ථාවර තැන්පතු, දේපළ උකස් කිරීම, වාහන බදු දීම මගින් හෝ ආයතනයේ ණය ධාරිතාවට |

| | | |
|---|---|---|
| | | උචිත වන පරිදි වගකීම සහ ආරක්ෂාව ඉල්ලා සිටිය හැකිය. |
| රන් ණය | රන් මූල්‍යකරණය යටතේ උපරිම මාස 12ක කාලයකට රන් සහ රන් ආභරණය සඳහා මූල්‍ය අත්තිකාරම් නිකුත් කෙරෙයි. ණය මුදල සහ නියමිත පොලිය සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් වන තෙක් රන් ආභරණ ආයතනය භාරයේ සුරක්ෂිතව තබා ගනු ඇත. | • රන් සඳහා අත්තිකාරම් මුදල් ලබා දෙන්නේ රන්වල බර සහ කැරට් වටිනාකම මත පදනම් වෙමින් වන අතර කැරට් වටිනාකම එක් එක් අවස්ථාවල එකිනෙකින් වෙනස් වේ.<br>• කැරට් 14ත් 24ත් අතර රන් පමණක් මෙහිදී මූල්‍යකරණය සඳහා පිළිගැනෙයි. |
| ස්ථාවර තැන්පතු | ස්ථාවර තැන්පතු මගින් තැන්පත්කරුවෙකුට ඉහළ පොලී අනුපාතයක් ලබා ගත හැකිය. මාසිකව හෝ කල් පිරීමෙන් පසුව පොලී මුදල් ලබා ගැනීමේ හැකියාව ඇත. | • තැන්පතු කාල සීමාව - මාස 01 සිට මාස 60 දක්වා<br>• තැන්පතුකරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු හෝ ද්විත්ව පුරවැසියෙකු විය යුතු අතර වයස අවුරුදු 18ට වඩා වැඩි විය යුතුය.<br>• අවම තැන්පතු මුදල රු. 10,000/=කි.<br>• ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ආයතන වෙතින් තැන්පතු පිළිගනු ඇත.<br>• තැන්පත් කරන දිනය වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද පුද්ගලයින්ට ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුමක් විවෘත කිරීමේ අවස්ථාව සැලසෙයි.<br>• තැන්පත්කරුවන්ට මාසිකව, කාර්තු වශයෙන්, වාර්ෂිකව, ද්වි වාර්ෂිකව හෝ කල් පිරීමෙන් අනතුරුව පොලී ලබා ගැනීමේ හැකියාව ඇත. පොලී අනුපාත වාර්ෂික පදනමින් දක්වා ඇති අතර පොලී සරල අනුපාත අනුව එකතු වේ. කල් පිරීමේදී පොලිය ගෙවිය යුතු ස්ථාවර තැන්පතු සඳහා පමණක් කාල සීමාව අවසානයේ ගණනය කිරීම් සිදු කර අදාළ පොලිය ගෙවනු ලැබේ. මාසික පොලී අනුපාතය ගණනය කරනු ලබන්නේ වාර්ෂිකව ලබා දෙන පොලී අනුපාතය ගණනය කර එය 12න් (මාස 12න්) බෙදීමෙනි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ස්ථාවර තැන්පතු රෙගුලාසි සහ නියාමනයන්ට අනුව සියලුම ගණනය කිරීම් සහ ගෙවීම් සිදු වේ.<br>• ස්ථාවර තැන්පතු සඳහා පොලී ගණනය කර ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මාරු කිරීමේදී බදු |

| | | |
|---|---|---|
| | | සම්බන්ධ මාර්ගෝපදේශන සළකා බැලෙයි.<br>• පොලී උපයා ගැනීමට නම් ස්ථාවර තැන්පතු අවම වශයෙන් අඛණ්ඩව දින 30ක් පැවතිය යුතුය.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නියම කරන ලද අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ආයතනය විසින් පාරිභෝගිකයාගෙන් ඉල්ලා සිටින තොරතුරු ලබා නොදෙන්නේ නම් ස්ථාවර තැන්පතු අවස්ථාව ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ බලය ආයතනය සතු වේ.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මගින් තැන්පත්කරුවන් රක්ෂණය කර ඇති අතර තැන්පත්කරුවන්ට ගෙවිය යුතු උපරිම වන්දි මුදල 1,100,000/=ක් ලෙස ද නිර්දේශ කර ඇත.<br>• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව කල් පිරීමට පෙර ලබා ගන්නා තැන්පතු සඳහා දඩුවම් මූල්‍ය අනුපාතයක් ලබා ගැනීමේ හැකියාව ඇත.<br>• තැන්පත් කරන අවස්ථාවේ ලබා දෙන උපදෙස්වලට අනුව තැන්පතු කල් පිරීමෙන් අනතුරුව ප්‍රතිලාභියාගේ ගිණුමට පමණක් මුදල් බැර කරනු ලැබේ. |
| ඉතුරුම් | ඔරියන්ට් ෆිනෑන්ස් සමාගම විසින් ඉතාම සුළු ඉතුරුම් ගිණුම්වල සිට ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් ගිණුම් දක්වා පුළුල් පරාසයක ඉතුරුම් අවස්ථා පාරිභෝගිකයාට ලබා දී ඇති අතර ඒ ඔස්සේ ඉහළ ප්‍රතිලාභ ලබා දීමටත් අවශ්‍ය වූ විට මුදල් ආපසු ලබා ගැනීමේ පහසුකම් ලබා දීමටත් කටයුතු සලසා දී ඇත. ගෙවනු ලබන පොලී අනුපාතය ගිණුමේ ශේෂය සහ ගිණුමේ ස්වභාවය අනුව වෙනස් වේ. | • ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු හෝ ද්විත්ව පුරවැසියෙකු වන වයස අවුරුදු 18ට වඩා වැඩි ඕනෑම පුද්ගලයෙකුට ගිණුම් විවෘත කිරීම සඳහා ඉල්ලුම් කළ හැකිය.<br>• ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ආයතන වෙතින් තැන්පතු පිළිගනු ඇත.<br>• අලුත උපන් දරුවන් හෝ වයස අවුරුදු 18ට අඩු දරුවන් සඳහා ඉතුරුම් ගිණුම් විවෘත කිරීමේ හැකියාව ඇති අතර දෙමව්පියන් හෝ නීත්‍යානුකූල භාරකරුවෙක් ගිණුම් හිමියා ලෙස පත් කෙරෙයි.<br>• පොලී ගණනය කිරීම් : සියලුම ඉතුරුම් ගිණුම් සඳහා දිනපතා පොලී ගණනය කරනු ලබන අතර එය සරල පොලී පදනම මත සිදු කෙරෙයි. එම පොලී මුදල් |

| | | |
|---|---|---|
| | | වාර්ෂිකව උපුටා දක්වනු ලබන අතර මාසිකව ගිණුමට බැර කෙරෙයි. |
| Ijarah කල්බදු සේවාව | Ijarah කල්බදු සේවාව ප්‍රධාන වශයෙන් පුද්ගලික සහ ව්‍යාපාරික අවශ්‍යතා වෙනුවෙන් ලියාපදිංචි කළ සහ ලියාපදිංචි නොකළ වාහන සඳහා ලබා දෙයි. නවතම යන්ත්‍ර සූත්‍ර සඳහා ද Ijarah කල්බදු පහසුකම ලබා දෙන අතර අයදුම්කරු හෝ අයදුම්කාරිය කල්බදු ගෙවීම් සපුරාලීමට තමා සතු වන ශක්‍යතාවය තහවුරු කළ යුතුය. | • යම් කිසි වත්කමක් තමන් සතු කර ගැනීමේ අවශ්‍යතාවය ඇති සහ කල්බදු ගෙවීමේ හැකියාව ඇති වයස අවුරුදු 18ට වැඩි පුද්ගලයෙකුට හෝ අයතනයකට මේ සඳහා අයදුම් කිරීමේ හැකියාව ඇත.<br>• ණය සඳහා වන අගය අනුපාතය (Loan toValue - LTV) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය සහ අයදුම්කරුගේ යෝග්‍යතාවය මත තීරණය වේ.<br>• කල්බදු කාල සීමාව - මාස 12 සිට මාස 60 දක්වා<br>• නැවත ගෙවීම : පෙර එකඟතාවය ලද කාලසටහනට අනුව සමාන වාරික කොටස් වශයෙන් හෝ හිඟ මුදල් සමඟ එකවර හෝ ගෙවීම් කළ යුතුය. |
| Wakalah කාලීන ආයෝජන | Wakalah කාලීන ආයෝජන මගින් ආයෝජකයෙකුට මාසිකව හෝ වාර්ෂිකව ආදායමක් උපයා ගත හැකිය. පාරිභෝගිකයාගේ අභිමතය පරිදි ලාභය මාසිකව හෝ කල් පිරෙන විට ලබා ගත හැකිය. | • තැන්පතු කාල සීමාව - මාස 01 සිට මාස 60 දක්වා<br>• තැන්පතුකරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු හෝ ද්විත්ව පුරවැසියෙකු විය යුතු අතර වයස අවුරුදු 18ට වඩා වැඩි විය යුතුය.<br>• අවම තැන්පතු මුදල රු. 5000/=කි.<br>• ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ආයතන වෙතින් තැන්පතු පිළිගනු ඇත.<br>• තැන්පත් කරන දිනය වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද පුද්ගලයින්ට ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුමක් විවෘත කිරීමේ අවස්ථාව සැලසෙයි.<br>• ආයෝජකයන්ට මාසිකව, කාර්තු වශයෙන්, වාර්ෂිකව, ද්වි වාර්ෂිකව හෝ කල් පිරීමෙන් අනතුරුව ලාභ ලබා ගැනීමේ හැකියාව ඇත. ලාභය වාර්ෂික පදනමින් දක්වා ඇති අතර සරල මිල අනුපාත අනුව පොලී ගණනය කිරීම් සිදු වේ. කල් පිරීමෙන් පසුව ලාභය ගෙවනු ලබන ආයෝජනවල ගණනය කිරීම් පමණක් අදාළ කාල සීමාව පූර්ණය කිරීමෙන් පසු සිදු කරනු ඇත. මාසික ලාභ අනුපාතය ගණනය කරනු ලබන්නේ වාර්ෂිකව ලබා දෙන ලාභය ගණනය කර එය 12න් |

| | | |
|---|---|---|
| | | (මාස 12න්) බෙදීමෙනි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද Wakalah ආයෝජන රෙගුලාසි සහ නියාමනයන්ට අනුව සියලුම ගණනය කිරීම් සහ ගෙවීම් සිදු වේ.<br>• Wakalah ආයෝජන සඳහා ලාභය ගණනය කර ප්‍රතිලාභීන්ගේ ගිණුම්වලට මාරු කිරීමේදී බදු සම්බන්ධ මාර්ගෝපදේශන සළකා බැලෙයි.<br>• ලාභ උපයා ගැනීමට නම් Wakalah ආයෝජනය අවම වශයෙන් අඛණ්ඩව දින 30ක් පැවතිය යුතුය.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නියම කරන ලද අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ආයතනය විසින් ආයෝජකයාගෙන් ඉල්ලා සිටින තොරතුරු ලබා නොදෙන්නේ නම් ආයෝජන ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ බලය ආයතනය සතු වේ.<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ආයෝජකයන් රක්ෂණය කර ඇති අතර ආයෝජකයින්ට ගෙවිය යුතු උපරිම වන්දි මුදල 1,100,000/=ක් ලෙස ද නිර්දේශ කර ඇත.<br>• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කර ඇති මාර්ගෝපදේශයන්ට අනුව කල් පිරීමට පෙර නැවත ලබා ගන්නා ආයෝජන සඳහා දඩුවම් මූල්‍ය අනුපාතයක් නිකුත් කිරීමේ හා අය කර ගැනීමේ හැකියාව ඇත.<br>• ආයෝජන අවස්ථාවේ ලබා දෙන උපදෙස්වලට අනුව ආයෝජන කල් පිරීමෙන් අනතුරුව ප්‍රතිලාභියාගේ ගිණුමට පමණක් මුදල් බැර කරනු ලැබේ. |
| සූර්ය පැනල කල්බදු | සූර්ය පැනල කල්බදු සේවාව ගෘහස්ථ භාවිතය සහ ව්‍යාපාරික භාවිතය සඳහා සූර්ය පැනල මාදිලි කිහිපයක් ඔස්සේ ලබා දෙයි. අයදුම්කරු විසින් කල්බදු ගෙවීම් සපුරාලීමට තමා සතු වන ශක්‍යතාවයත් ලංකා විදුලිබල මණ්ඩලය සහ පාරිභෝගිකා අතර වන එකඟතාවයන් | • ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනයේ ඕනෑම පාරිභෝගිකයෙකුට, ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනයේ සහ ජනශක්ති සමූහ ව්‍යාපාරයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට වයස අවුරුදු 18 සම්පූර්ණ කර ඇත්නම් සූර්ය පැනල කල්බදු සේවාව සඳහා අයදුම් කළ හැකි අතර |

| | | |
|---|---|---|
| | නිවැරදිව පූර්ණය කිරීමට ඇති ශක්‍යතාවයත් වඩාත් ක්‍රමවත්ව තහවුරු කළ යුතුය. | කල්බදු ගෙවීමේ ශක්‍යතාවය සහිත වත්කම් තිබිය යුතුය.<br>• ඒකක වටිනාකමෙන් 70%ක අනුපාතයක් පමණක් ණය වශයෙන් ලබාදෙන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය සහ ණය ලබාගැනීම සඳහා අයදුම්කරු තුළ ඇති යෝග්‍යතාවය මත නිර්දේශ කෙරෙනු ඇත.<br>• කල්බදු කාල සීමාව - මාස 12 සිට මාස 60 දක්වා<br>• නැවත ගෙවීම : පෙර එකඟතාවය ලද කාලසටහනට අනුව සමාන වාරික කොටස් වශයෙන් හෝ හිඟ මුදල් සමඟ එකවර හෝ ගෙවීම් කළ යුතුය. |
| ආපසු ගෙවීමේ මූල්‍ය ණය | අපගේ ස්ථාවර තැන්පතු හරහා ලබා දෙන මූල්‍ය ණය - ඔබේ ස්ථාවර තැන්පතුවෙන් 75%ත් 90%ත් අතර ප්‍රමාණයක් පොලී අහිමි නොවී මුදල් වශයෙන් ලබා ගත හැකිය. ඔබේ ප්‍රාග්ධන තැන්පතුවේ අගය නොවෙනස්ව පවත්වා ගනිමින් ස්ථාවර තැන්පතුව කල් පිරීමට පෙර ඕනෑම අවස්ථාවක එම මුදල නැවත ගෙවිය යුතුය. | • ඔරියන්ට් ෆිනෑන්ස් ස්ථාවර තැන්පතු හිමියන්ට සහ Wakalah කාලීන ආයෝජකයන්ට මෙම මූල්‍ය ණය පහසුකම ලබා ගත හැකිය.<br>• තැන්පතුවල මාසික පොලියෙන් ණය පොලී අය කර ගන්නා අතර ගිණුම කල් පිරුණු ගිණුම් හිමියන් විසින් අදාළ පොලිය නියමිත දිනයේදී මාසිකව ගෙවිය යුතුය.<br>• ස්ථාවර තැන්පතු කල් පිරීමෙන් පසුවත් ඔබට ණය ශේෂය අඛණ්ඩව පවත්වා ගැනීමට අවශ්‍ය නම් සමස්ත ණය සහ පොලී පියවා ගිණුම අවසන් කර අලුත් ගිණුමක් නැවත විවෘත කළ යුතුය. |

## B. පොලී අනුපාතයන්

- ණය සඳහා වන පොලී අනුපාත ණය පහසුකමේ වර්ගය, ගෙවීම් කාල සීමාව සහ ලබා දෙන වගකීම මත රඳා පවතියි. පොලී අනුපාතයන් වෙළෙඳපොළ තත්ත්වයන් මත පදනම් වී කලින් කලට සංශෝධනය විය හැකිය.
- ඉතුරුම් තැන්පතු සඳහා වන පොලී අනුපාත අපගේ සියලුම ශාඛාවල ප්‍රදර්ශනය කර ඇති අතර www.orientfinance.lk වෙබ් අඩවියෙන් ද එම තොරතුරු ලබා ගත හැකිය.

## C. වෙනත් ගෙවීම්, ගාස්තු සහ කොමිස් මුදල්

- ලේඛන ගාස්තු, රක්ෂණ වාරික මුදල්, රජයේ අනුමත බදු (අදාළ නම් පමණක්), තක්සේරු ගාස්තු (අදාළ නම් පමණක්) ණය ගැනුම්කරු විසින් දරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ණය පහසුකම ලබාදීම පිළිබඳ මූලික සාකච්ඡාව සිදු කරන අවස්ථාවේදී සමාගම විසින් නිශ්චිතව ප්‍රකාශ කරනු ඇත. අයදුම්කරුවන් විසින් සිදු කළ යුතු සියලුම ගෙවීම් සහ ගාස්තු පිළිබඳව අදාළ ලිපියේ පැහැදිලිව සඳහන් වේ.

- පිරනමනු ලබන ඕනෑම වර්ධක ප්‍රතිලාභයක් හෝ ණය පහසුකම්වලට අදාළ ඇතැම් පිරිවැය අගයන් ණය හිලව් කිරීමක් ලෙස එකතු කර ගැනීමට ආයතනයට හැකිය. පාරිභෝගිකයා විසින් එකඟ වූ වාරිකය හෝ කුලිය සඳහා එම ප්‍රතිලාභ හෝ පිරිවැය හිලව් වේ.
- තැන්පතුකරුවෙකු ණය පහසුකම් ඉල්ලා සිටින විට තැන්පතු පිළිබඳ වගකීම, පොලී අනුපාත සහ වෙනත් ගාස්තු පිළිබඳව ණය ඉල්ලීමට අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී දැනුම් දිය යුතුය.
- ගෙවීම් කාල සීමාව මාස දෙකකට හෝ ඊට වැඩි කාලයක් හිඟ ලෙස පවතින්නේ නම් පාරිභෝගිකයාගෙන් 01%ක දඩ මුදලක් අය කර ගනු ලැබේ.

## වර්තමාන ගෙවීම් ආකෘතිය

වගුව 01

2024.12.01 දිනට යාවත්කාලීන කරන ලද තොරතුරු

| ගෙවීම් ප්‍රවර්ගය | ගාස්තු ප්‍රවර්ගය/කොමිස් අගය | අගය/මුදල |
|---|---|---|
| **වත්කම් නිෂ්පාදන** | | |
| | | |
| කල්බදු | | |
| රු. 130,000/=ට අඩු ත්‍රී රෝද රථ | ලිපිලේඛන ගාස්තු | රු. 5,000/= |
| රු. 130,001/=ට වැඩි ත්‍රී රෝද රථ | ලිපිලේඛන ගාස්තු | රු. 6,500/= |
| බට්ටා ලොරි | ලිපිලේඛන ගාස්තු | අවම වශයෙන් රු. 7,500/=ක් හෝ සමස්ත මුදලෙන් 0.75%ක් |
| වෙනත් කල්බදු පහසුකම් | ලිපිලේඛන ගාස්තු | රුපියල් මිලියනයට වැඩි - රු. 7,500/=<br>රුපියල් 1,000,001/=ත් මිලියන 2.5ත් අතර - රු. 12,500/=<br>රුපියල් 2,500,001/=ත් මිලියන 5ත් අතර - රු. 17,500/=<br>රුපියල් 5,000,001/=ත් මිලියන 7.5ත් අතර - රු. 22,500/=<br>රුපියල් 10,000,001/=ත් මිලියන 25ත් අතර - රු. 30,000/=<br>රුපියල් 25,000,001/=ට වැඩි - රු. 40,000/= |
| ක්ෂුද්‍ර කල්බදු | විමර්ශන ගාස්තු (ක්ෂුද්‍ර කල්බදු සඳහා පමණි) | අදාළ නොවේ |

| | | |
|---|---|---|
| **ණය පහසුකමට අදාළ ගෙවීම් ක්‍රියාවලිය** | මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ කටයුතු මෙහෙයවීමේ ගාස්තු/ මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ අතිරික්ත ගාස්තු | රු. 2000/= |
| | මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතාවය | අදාළ නොවේ |
| | ණය තොරතුරු කාර්යංශයේ එක් පුද්ගලයෙකු සඳහා ගෙවීම් | රු. 875/= |
| | එක් පුද්ගයෙකු සඳහා නම් ප්‍රදර්ශනය කිරීම | රු. 250/= |
| | මෝටර් රථ ලියාපදිංචි දෙපාර්තමේන්තුවේ විරෝධතා නොමැති බව සහතික කිරීම | රු. 500/= |
| | දෙවන තොරාගැනීමට ගාස්තුව | රු. 250/= |
| | | |
| | | |
| ත්‍රීරෝද රථ සඳහා කල්බදු | ජීවන රක්‍ෂණ ගාස්තු | රු. 1,300/= |
| යතුරු පැදි | ජීවන රක්‍ෂණ ගාස්තු | රු. 540/= |
| කුඩා ට්‍රක්/ මෝටර් ලොරි/ මෝටර් කෝච් රථ/ JCB රථ/ වෑන් රථ/ ඩබල් කැබ් රථ | ජීවන රක්‍ෂණ ගාස්තු | රු. 2,700/= |
| කාර් රථ/SUV රථ | ජීවන රක්‍ෂණ ගාස්තු | රු. 5,400/= |
| ත්‍රීරෝද රථ | රක්‍ෂණ හැසිරවීමේ ගාස්තු (පළමු වසරේ පමණයි) | රු. 2,000/= |
| කුඩා ට්‍රක්/ මෝටර් ලොරි/ මෝටර් කෝච් රථ/ JCB රථ/ වෑන් රථ/ ඩබල් කැබ් රථ | රක්‍ෂණ හැසිරවීමේ ගාස්තු (පළමු වසරේ පමණයි) | රු. 2,500/= |
| කාර් රථ/SUV රථ | රක්‍ෂණ හැසිරවීමේ ගාස්තු (පළමු වසරේ පමණයි) | රු. 2,500/= |
| | වත්කම් නැවත ස්ථානගත කිරීමේ ගාස්තු | එක් ගනුදෙනුවකට රු. 7,500/= |
| | ප්‍රතිව්‍යුහගත කිරීමේ/නැවත ලේඛනගත කිරීමේ ගාස්තු | පහසුකම් සපයන මුදලෙන් රු. 5,000/=ක් හෝ 0.30%ක්, උපරිම වශයෙන් රු. 25,000/=ක් |
| | **අවසන් කිරීමේ පූර්ව ගාස්තු** | අදාළ නොවේ |

<table>
<tr><td>ණය පහසුකම්</td><td>ලේඛන ගාස්තු</td><td>සමස්ත මුදලෙන් 1%ක්</td></tr>
<tr><td></td><td>වත්කම් පරීක්ෂාව</td><td>අදාළ නොවේ</td></tr>
<tr><td>ආපසු ගෙවීමේ පහසුකම්</td><td>ලිපිලේඛන ගාස්තු</td><td>ණය මුදලෙන් 1%ක්</td></tr>
<tr><td></td><td>රක්ෂණ වගකීම</td><td></td></tr>
<tr><td>ප්‍රතිසාධනය</td><td>LOT තැපැල් ගාස්තු</td><td>රු. 500/=</td></tr>
<tr><td></td><td>NOT තැපැල් ගාස්තු</td><td>රු. 250/=</td></tr>
<tr><td></td><td>ප්‍රතිසාධනයේ පසුවිපරම් ගාස්තුව</td><td>රු. 20,000/=ක උපරිමයකට යටත්ව සමස්ත මුදලෙන් 1%ක්</td></tr>
<tr><td></td><td>චෙක්පත් අගරු වීමේ ගාස්තු (එක් චෙක්පතකට අදාළව)</td><td>රු. 2,000/=</td></tr>
<tr><td></td><td>පෙර සැකසුම් පොලිය</td><td>එක් මසකට සමස්ත මුදලෙන් 3%ක්</td></tr>
<tr><td></td><td>පියවීම් ගාස්තුව</td><td>රු. 3,000/=</td></tr>
<tr><td></td><td>නැවත ලබාගැනීමේ ගාස්තු
<table>
<tr><th>වාහනයේ ස්වභාවය</th><th>කිලෝ මීටර් 50 හෝ ඊට අඩු</th></tr>
<tr><td>ත්‍රීරෝද රථ</td><td>රු. 40,000/=</td></tr>
<tr><td>කාර් රථ, වෑන් රථ හෝ ද්විකාර්ය රථ</td><td>රු. 70,000/=</td></tr>
<tr><td>ලොරි, බර වාහන, ටිපර් රථ, මෝටර් කෝච්</td><td>රු. 80,000/=</td></tr>
</table></td><td>
<table>
<tr><th>කිලෝ මීටර් 50න් පසු අමතර කිලෝමීටරයකට අගය</th></tr>
<tr><td>රු. 150/=</td></tr>
<tr><td>රු. 200/=</td></tr>
<tr><td>රු. 250/=</td></tr>
</table></td></tr>
<tr><td></td><td>නැවත ලබාගැනීමේ අධිභාරය</td><td>5%ක නැවත ලබාගැනීමේ ගාස්තු</td></tr>
</table>

| | | |
|---|---|---|
| | **අංගනයේ වාහන නවතා තැබීම** | |
| | වාහන අංගන ගාස්තු - යතුරු පැදි (දිනකට) | රු. 100/= |
| | වාහන අංගන ගාස්තු - ත්‍රීරෝද රථ (දිනකට) | රු. 100/= |
| | වාහන අංගන ගාස්තු - කාර් රථ (දිනකට) | රු. 250/= |
| | වාහන අංගන ගාස්තු - කැබ් රථ, ජීප් රථ, වෑන් රථ, බට්ටා ලොරි (දිනකට) | රු. 250/= |
| | වාහන අංගන ගාස්තු - ලොරි රථ, ටිපර්, බවුසර්, ට්‍රැක්ටර් (දිනකට) | රු. 250/= |
| | වාහන අංගන ගාස්තු - දිග වාහන, JCB, කන්ටේනර්, ප්‍රයිම් මූවර් (දිනකට) | රු. 250/= |
| | | |
| | බිල්පත් ගාස්තු (එක් බිල්පතකට) | රු. 1,000/= |
| | | |
| **රන් ණය** | මුද්දර ගාස්තු | රු. 25,000/=ට වැඩි ගනුදෙනු සඳහා රු. 25/=ක මුදලක් අය කෙරෙයි |
| | සිහි කැඳවීමේ ගාස්තු (පළමු සිහි කැඳවීම) | රු. 55/= |
| | සිහි කැඳවීමේ ගාස්තු (දෙවන සිහි කැඳවීම) | රු. 55/= |
| | සිහි කැඳවීමේ ගාස්තු (අවසන් සිහි කැඳවීම) | රු. 115/= |
| | | |
| | වෙන්දේසි ගාස්තු | 3% |
| | | |
| **වාහන අංගන** | අංගන තක්සේරු ගාස්තු | |
| | යතුරු පැදි | රු. 800/= |
| | ත්‍රීරෝද රථ | රු. 800/= |
| | කාර් රථ | රු. 1,300/= |
| | කැබ් රථ, ජීප් රථ, වෑන් රථ, බට්ටා ලොරි | රු. 1,300/= |
| | ද්විකාර්ය රථ | රු. 1,500/= |
| | ලොරි රථ, ටිපර් රථ, බවුසර්, බස් රථ, ට්‍රැක්ටර් | රු. 2,000/= |
| | දිග වාහන, JCB, කන්ටේනර්, ප්‍රයිම් මූවර් | රු. 2,500/= |

| | | |
|---|---|---|
| බැරකම් නිෂ්පාදන | | |
| | | |
| ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු සම්බන්ධ ගෙවීම් | රඳවා ගැනීමේ බද්ද පිළිබඳ ලිපි හා ශේෂයට අදාළ නීත්‍යානුකූල ලේඛන නිකුත් කිරීම<br>බදු හා සම්බන්ධ තහවුරු කිරීමේ ලිපි | ගාස්තු අය නොකෙරේ |
| | අනුපිටපත් නිකුත් කිරීම/පොත්/ අනුපිටපත් ඉවත් කිරීම | රු. 5,000/= |
| | ඉතුරුම් ගිණුම් වසා දැමීමේ ගාස්තු | රු. 500/= |

D. ඔරියන්ට් ෆිනෑන්ස් වෙතින් නිෂ්පාදන හා සේවා ලබා දීමේ ක්‍රියාපටිපාටිය

- ඔරියන්ට් ෆිනෑන්ස් වෙතින් සේවා සහ නිෂ්පාදන ලබාගැනීමට අපේක්ෂා කරන සියලුම ගනුදෙනුකරුවන් අපගේ ශාඛාවකට පැමිණීම හෝ ශාඛාවක් සම්බන්ධ කර ගැනීම කළ යුතුය. http://www.orientfinance.lk/contact-us/ වෙබ් අඩවිය ඔස්සේ අපේ ශාඛා පිහිටි ප්‍රදේශ සහ ඒවා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ලබා ගත හැකිය.
- ඔරියන්ට් ෆිනෑන්ස්හි බලයලත් නිලධාරියෙකු සමඟ ඔබගේ අවශ්‍යතාවය පිළිබඳව සාකාච්ඡා කිරීමෙන් අනතුරුව ආයතනය විසින් ලබා දෙන යෝජනා පිළිබඳව සළකා බලා සිය අවශ්‍යතාවයට අදාළ අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම් කරන ලද භාණ්ඩ හා සේවාවන්ට අදාළව ආයතනය විසින් ඉල්ලා සිටින ලියකියවිලි ඇගයුම් සහ සැකසුම් කටයුතු සඳහා ශාඛාවට ලබා දිය යුතුය.
- ඇගයීම් ක්‍රියාවලියේ කොටසක් ලෙස බලයලත් නිලධාරියෙකු විසින් පාරිභෝගිකයගේ ඉල්ලීමට අදාළ ව්‍යාපාරික ස්ථානය හෝ පෞද්ගලික නේවාසික ස්ථානය විමර්ශනයට ලක් කරනු ඇත.

E. පූර්ණය නොකරන ලද මුදල් ආපසු ගෙන ගිණුම වසා දැමීම හෝ වන්දි ගෙවීම

- කල්බදු නිෂ්පාදන : ගෙවීම්වලට අදාළ කාල සීමාව මත පදනම් වූ පහසුකමක් ලෙස ඉදිරියේදී ගෙවිය යුතු පොලී සඳහා වට්ටමක් ලබා දෙයි.
- ඉතුරුම් : ඔරියන්ට් ෆිනෑන්ස් වෙත කරනු ලබන නිසි දැනුම්දීමකින් පසුව අඩු පොලී අනුපාතයක් යටතේ මුදල් ආපසු ගැනීමේ හැකියාව ඇත. තැන්පතු කාල සීමාව අනුව පොලී අනුපාතය ගණනය කරනු ලබන අතර ගෙවූ අතිරික්ත පොලිය නැවත ආයතනයට ගෙවිය යුතුය. තැන්පතුවල ඇති මුදලෙන් අතිරික්ත පොලිය අඩු කර ගනු ලැබේ.

F. ණය මුදල් නැවත අය කර ගැනීමේ ක්‍රියාපටිපාටිය

- ණය මුදල් නැවත ගෙවීම ගනුදෙනුකරුවන්ට පහසු කිරීමට ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනය හැකි සෑම උත්සහයක්ම දරයි. ආයතනය විසින් අනුගමනය කරන සමස්ත ණය ප්‍රතිපත්තියට අනුගතව ගනුදෙනුකරුගේ හැකියාවන් සහ ශක්‍යතාවයන් සළකා බලා ණය ගෙවීමේ කාල සීමාව නැවත සැලසුම් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කළ හැකිය.
- ගනුදෙනුකරුවන්ට අදාළ කාල සීමාව තුළ ණය පියවීම සිදු කිරීමට නොහැකි වූ විට ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනය විසින් ණය ගිවිසුමේ අන්තර්ගත රෙගුලාසිවලට සහ රටේ සමස්ත නීතිමය රාමුවට අනුකූලව ණය මුදල් නැවත අය කර ගැනීමේ ක්‍රියාවලිය අරඹනු ඇත. ගිවිසුමට අනුව ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ආයතනය විසින් ප්‍රතිසාධන නිලධාරීන් යොදවා අවශ්‍ය පියවර

ගැනීමට කටයුතු කරන්නේ නම් ඒ වෙනුවෙන් වැය වන පිරිවැය ද ගනුදෙනුකරුවන්ගෙන් අය කර ගැනෙයි. එසේම මෙම ක්‍රියාවලියේදී ආයතනය විසින් දරන නීති වියදම් ඇතුළු සෙසු සියලුම වියදම් ගනුදෙනුකරු විසින් දැරිය යුතුය.

G. පාරිභෝගිකයන්ගේ තොරතුරු හෙළිදරව් කිරීම

- 2011 අංක 42 දරණ මූල්‍ය ව්‍යාපාර පනතේ 61 (2) වගන්තියේ විධිවිධානවලට යටත්ව ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනය පාරිභෝගිකයා සමඟ කරනු ලබන සියලුම ගනුදෙනුවල රහස්‍ය භාවය උපරිමයෙන් රැකීමට කටයුතු කරයි.
- කෙසේ වෙතත් ඔරියන්ට් ෆිනෑන්ස් ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයන්ට යටත්ව ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකා මහ බැංකුවට සහ වෙනත් ව්‍යවස්ථාපිත ආයතනවලට නීතිමය අවශ්‍යතා සහ වෙනත් නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා වෙනුවෙන් පාරිභෝගිකයාට පූර්ව දැනුම් දීමකින් තොරව පාරිභෝගිකයා පිළිබඳවත් ගනුදෙනු පිළිබඳවත් තොරතුරු ලබා දීමට බැඳී සිටියි.

H. 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීම පිළිබඳ පනත

- කිසියම් නීති විරෝධී ක්‍රියාවක් හෝ අපරාධ වරදක් සිදු කිරීම හේ එවැන්නකට උත්සහ කිරීම සම්බන්ධයෙන් සැක කිරීමට සාධාරණ හේතු CFC සතුව තිබේ නම් 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 07 වන වගන්තියේ එන නීති ප්‍රකාරව මූල්‍ය බුද්ධි ඒකකයට දැනුම් දෙනු ඇත.

I. අදාළ අනෙකුත් නීතිමය විධිවිධාන

- 2000 අංක 56 දරණ මූල්‍ය කල්බදු පනත, 1949 අංක 46 දරණ උකස්කරණ පනත, 1982 අංක 29 දරණ පාරිභෝගික ණය සේවා පිළිබඳ පනත ඇතුළු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සෙසු නීතිමය රෙගුලාසි, අණපනත් යටතේ සියලුම සේවා සහ නිෂ්පාදන සම්පාදනය කෙරෙයි.

J. පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය

- අපගේ පාරිභෝගිකයන්ට ගුණාත්මක සහ කඩිනම් සේවාවක් ලබා දීමේ පූර්ණ සහ ප්‍රමාණවත් නිපුණතාවයක් ඇති වන ආකාරයෙන් අපගේ කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දී ඇත. කෙසේ වුවත් අප විසින් ලබා දෙන සේවාවන් සම්බන්ධයෙන් යම් යම් ගැටලුකාරී තත්ත්වයන් ඔබට ඇති වන්නේ නම් ඒ පිළිබඳව ඔබගේ ප්‍රතිචාර සහ ප්‍රතිපෝෂණයන් ලබා ගැනීමට අපි නිරන්තර සූදානමෙන් පසුවෙමු. +94 117 577 577 සහ +94 777 710 800 දුරකථන අංක හරහා හෝ info@orient.lk ඊමේල් ලිපිනය හරහා ඔබගේ ප්‍රතිචාර අප වෙත ලබා දීමට අවස්ථාව සලසා ඇති අතර ඒ ඔස්සේ ඔබගේ ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දීමට අපි සහතික වශයෙන් කටයුතු කරමු.
- අප විසින් ලබා දෙන විසඳුම්වලින් ඔබ තෘප්තිමත් නොවන්නේ නම් අපගේ මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයා (මූල්‍ය පැමිණිලි කොමසාරිස්වරයා) වෙත ඔබේ ගැටලුව ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත. ඔහුගේ විෂය සීමාව යටතේ ගනුදෙනුකරුවන් සහ මූල්‍ය ආයතනය අතර පවත්නා ඕනෑම පැමිණිල්ලක් හෝ ගැටුමක් පිළිබඳව විමසා බලා උචිත විසඳුම් ලබා දීමට ඔහුට පූර්ණ බලතල පවරා ඇත.

**මූල්‍ය පැමිණිලි කොමසාරිස්**

ෆයිනෑන්ෂල් ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා (ගැරන්ටි) ලිමිටඩ්,
143A වජිර පාර කොළඹ 04.
+94 11 259 5624